# Geek Magazine

## පරිගණක සහතිකපත්‍ර වැඩසටහන

Issue 01 - July 2021

PDF Version for Free

## පරිගණක දැණුම මදිද? අදම කියවන්න




**24% Discount**

### පරිගණක ඉංජිනේරුවරයෙක් වන්න අවශ්‍ය දැණුම

- Web Development
- School ICT Lessons
- Software Development
- Online Business
- Ethical Hacking
- Software Trics

**Video Tutorials**
**Software Pack**

DVD/Online Version Price

**මිල රු. 190/- යි (~~රු. 250~~)**


Rebelle 4 පරිගනක
වැඩසටහන භාවිතයෙන්
නිර්මාණය කරන ලද නිර්මාණයක්

# Contents


04 හැදින්වීම

05 පරිගණක දැණුමෙන් සපිරුනු ගීක් කෙනෙක් වෙන්නෙ කොහොමද?

06 අලුත් තාක්ෂණික තොරතුරු

07 Web Development
වෙබ් අඩවියක් හදමු

08 HTML, Bootstrap

09 jQuery, MySQL

10 PHP - වෙබ් සර්වර් ක්‍රමලේඛණය

11 ප්‍රයෝජනවත් වෙබ් අඩවි

13 O/L ICT, A/L ICT

14 IT for Office

15 Python Basic, Desktop App

16 Net Meter - ඩේට ඉතිරි කරගනිමු

18 Online Business
අන්තර්ජාලයෙන් මුදල් සෙවීම

19 Ethical Hacking
හැකිං වලින් බේරෙමු

20 පරිගණකයේ වයිරස් අයින් කරමු

21 Gimp - පොටෝ සංස්කරණය

23 Shotcut - විඩියෝ සංස්කරණය

24 නිර්මාණාත්මකව සිතන්න ඉගෙනගමු
ඉගැන්වීමට බාවිතා කරන මෙවලම්
ඉගෙනගන්න ක්‍රම

29 Documentory

31 Downloads

32 ඔබේ නිර්මාණ

33 ඔබේ ගැටලු

35 ගීක් ගිණුමක් සාදා ගනිමු

36 වීඩියෝ පාඩම් නරඹන ආකාරය

37 ගීක් මැගසින් එක මිලදී ගන්න විදිය

38 Comming Soon


39 Share කරල තෑගි දිනමු


## Instructors


Namal Jayathunga (BSc - Software Engineer)

Hasanka Hettiarachchi (BSc - Teacher)

Banuka Kannangara (B.Eng. - Undergraduate)




# හැඳින්වීම

පරිගණක දැනුම අත්‍යාවශ්‍ය යුගයක Geek Magazine එක යනු ඔබ වෙතට ඒ පරිගනක දැනුම ක්‍රමානුකූලව ගෙන එන මාසික සගරාවකි. මෙහි PDF Version එක නොමිලයේ Download කල හැකි අතර වීඩියෝ පාඩම් නැරඹීමට DVD/ Online Version එක රු 190/- ක මුදලකට මිලදී ගැනීමට පුලුවනි. මේ මගින් ඔබට විවිද මෘදුකාංග පිළිබන්දව ඉගෙන ගැනීමට හකියාව ලැබෙන අතර ඒවා කුඩා කොටස් ආකාරයට බෙදා අප විසින් උගන්වනු ලබයි.

DVD එක මිලදී ගැනීම තුලින් ඔබට ඒවා අන්තර්ජාලය නොමැතිව වුවද නැරඹීමට පුලුවනි. Online Version එක මිලදී ගැනීමෙන් එය Web Browser එකෙන් හෝ Desktop Magazine Viewer App එකෙන් හෝ Mobile App එකෙන් නරඹීමට පුලුවනි. එසේම DVD එක මගින් නොමිලේ තිබෙන මෘදුකාංග සියල්ලම ඔබට ලබා ගැනීමට හැකියාව ලැබේ. සියලුම පාඨමාලා අවසානයේ පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂනය අවසානයේ ඔබට eTeacing.lk ආයතනය මගින් සහතිකයක්ද නිකුත් කරනු ලැබේ. එය ඔබගේ Geek Profile එකටද එකතු වීම තුලින් ඔබ රැකියාවකට ඉල්ලුම් කිරීමේදී ඔබගේ Profile එක පෙන්වීමටද පුලුවනි. වීඩියෝ පාඩම් මාලා බලන ආකාරය 36 පිටුවෙන් ඉගෙන ගන්න.


Geek Magazine පළමු කලාපය මගින් Web Development පිළිබඳව පාඩම් මාළා 6ක් ඔබට ඉගෙන ගැනීමට පුලුවනි. එසේම Python පිළිබඳව පාඩම් මාළා 2ක් ඇතුලත්. අලුත් Science, Tech News ගැන වැඩසටහන් කීපයක්. Photoshop, Video Editing ගැන පාඩම් මාළා 2ක් ඇතුලත් වේ. Learning Technologies, Online Business ගැන වගේම Software Tools කීපයක් ගැන දැනුම අඩංගු වේ. මීට අමතරව එම Softwares DVD එකෙන් ලබා ගැනීමට හෝ අන්තර්ජාලයයෙන් Download කරගැනීමට Links ද සපයා ඇත.

අන්තර්ජාලයේ පිළිවෙලක් නොමැති අසීමිත තොරතුරු අතර හිරනොවී මුල සිට සංකීර්ණ කරුණු දක්වා සරලව ඉගෙන ගෙන Computer Geek කෙනෙක් වෙන්න, සහතික පත්‍රයක්ද ලබාග න්න Geek Magazine එකත් දිගටම සම්බඳ වන්න. ඔබට මේ හරහා ඉංග්‍රීසිත් පහසුවෙන් ඉගෙන ගන්න අවශ්‍ය Tools අප විසින් හඳුන්වා දී තිබෙනවාග මිලදී ගන්නා ආකාරය 37, 38 පිටු වලින් දැනගන්න පුලුවන්"

මිලදී ගැනීමට පිවිසෙන්න
https://eteaching.lk/magazine/geek/1

සම්පූර්ණ විස්තර සඳහා මෙම වීඩියෝව නරඹන්න
https://www.youtube.com/watch?v=EROsrERLkU4

මිලදී ගැනීමේ ගැටලු ඇත්නම් විමසන්න
Tel: 071-4551090




# පරිගණක දැණුමෙන් සපිරුණු ගීක් කෙනෙක් වෙන්නෙ කොහොමද?

වරක් ඇපල් සමාගමේ නිර්මාතෘ වන ස්ටීව් ජොබ්ස් විසින් පවසල තියෙනව ඇමරිකාවේ වෙසෙන සියලු දෙනා පරිගණක භාෂාවක් ඉගෙන ගතයුතුයි කියල. ඒ මගින් සිතීමේ හැකියාව වර්ධනය කරන නිසා. ඒ බව සාක්ෂාත් කරමින් ලෝකයේ ඉහලම ධනපතියන් අතර බහුතරය පරිගණක තාක්ෂණය හා සම්බන්ද නිර්මාණ කරන ලද පිරිස් වේ. එසේ නොවුනත් පරිගණක දැනුම ඇති අය අද සමාජයේ ඉහල තැනකට එමට අත්‍යාවශ්‍ය වී තිබේ. අප ගීක් පරිගණක ස    රාව නිර්මාණය කරන ලද්දේ ඒ දැණුම අපේ රටේ පුරවැසියන්ටත් ලබාදී ඔවුන්ද පරිගණක තාක්ෂනයේ ඉහල ස්ථානකයක ඔසවා තැඹීමටයි. මේ ලිපි මාලාවෙන් අප කතා කරනුයේ එසේ ඉහල පරිගණක දැනුමක් සහිත ගීක් කෙනෙක් වනේ කෙසේද යන්නයි.

ගීක් කෙනෙක් යනු ඉහල පරිගණක දැනුමක් සහිත වගේම සමාජය වෙනුවෙනුන්ත් නව නිර්මාණ සිදු කරන පුද්ගලයන්ටයි. පරිගණක ඉහල දැනුම ඇති යනනෙන් අදහස් කරන්නේ පරිගණකයක් ක්‍රියාකරන ආකාරය තේරුම්ගෙන පරිගණකයක් පාලනය කිරීමට මෘදුකාංග ලිවිය හැකි සහ ඕනෑම පරිගනක මෘදුකංගයක දැනුමක් ඉතා ඉක්මනින් ලබාගැනීමට හැකි පුද්ගලයන්ටයි.

ගීක් කෙනෙක් වන්න නම් මුලින්ම පරිගණකයක් සමග බොහෝ වෙලා ගත කිරීමට හැකි පුද්ගලයකු විය යුතුයි. එය පරිගණක ක්‍රීඩා කිරිමට නොවිය යුතු නමුත් පරිගණක ක්‍රීඩා කිරීමෙන් ඒ පුරුද්ද ඇති කරගැනීමට හැකියාව ලැබේ. පරිගණක තාක්ෂණය කියන්නේ ලෝකයේ ඉතා වේගෙන් අලූත් වන දැනුමක් කීවොත් නිවැරදියි. ඒ නිසා අලූත්වන තාකශණය ඉගෙන ගැනීමට හැකියාවක් තිබිය යුතුයි. ඒ සඳහා කරන්න තිබෙන්නෙ සමාජයට වැදගත් වන සමාජයේ ගැටලූවකට නව නිර්මාණ සිදු කිරීමයි. ඒ තුලින් ලැබෙන තෘපිතිය ඔස්සේ ඔබට පරිගණකයක් අසල බොහෝ වෙලා රැදීමට පුරුද්දක් ඇති කරවන අතර අලූත් දේවල් ඉක්මනින් ඉගෙන ගැනීමට හැකියාව ලබාදේ. අප ඉදිරි ලිපි වලින් මේ පිළිබඳව වැඩිදුරටත් කතා කරමු. ගීක් මැගසින් එකේ වීඩියෝ මාලා නරඹා පරිගණක දැනුම තියුණු කරගෙන ගීක් කෙනෙක් වෙනුණී කුඩා ළමුන්ටනම් එතනින් නොනැවතී පරිගණක ඉන්ජිනේරුවෙක් වීමට අවශ්‍ය දැණුමත් ලබා ගන්න පුලූවන්.

# අලුත් තාක්ෂණික




## Tech News

### Tiktok is going to integrate recrument tool


ටික්ටොක් ගෙන කවුරුත් දන්නෙ එය කුඩා වීඩියෝ බැලීමට හදන ලද වැඩසටහනක් කියල නේ. කොහොම හරි දැන් ටික්ටොක් වැඩිපුර අධ්‍යාපනික දේවල් එකතු කරන්න තමයි හදන්නෙ. ඉතින් ඔන්න දැන් එයාල කරන්න හදන්නෙ ටික්ටොක් හරහා ඔයලට ජොබ් හොයා ගන්න පුලුවන් විඩියෙ දෙයක් හදන්න. ඉතින් ඔයාලට ටික්ටොක් බලන ගමන් ඔයාට ගැලපෙනම ජොබ් එක හොයල දෙන්නත් මෙ ටික්ටොක් වැඩ කරාවි.

## Gaget News

### DJI New Drone

DJI කියන්නෙ ඉහල ගනයේ Drone Brand එකක් කීවොත් නිවැරදී. ඔන්න මෙයාල අලුත් වර්ශන් එකක් දාල Air 2S කියල. පාලනයක් පහසු කරන්න පුලුවන් විදියෙ දේවල් සහ හදිසි අවස්තාවල තනියම තීරන ගන්න පුලුවන් AI System එකක් එක්ක තමයි නිකුත් කරල තියෙන්නෙ.



## Science News

### China has landed a rover on Mars for the first time

ඇමරිකාවෙ නාසා අයතනය Perseverance Rover එක අගහරු වලට ගොඩබස්සල වැඩි කලක් යන්න මත්තෙන් ඔන්න චීනයත් තමන්ගෙම කියල රෝවර් එකක් අගහරුවලට සාර්ථකව ගොඩ බස්සල. ඉතින් මේකත් එක්ක චීනයත් ලෝකෙටම පෙන්නල තමන්ගෙ හැකියාවන්. ඉතින් දැන් දැන් රටවල් වෙන ලෝක වලට තරගෙනට යන්නෙ ජීවයක් සෙවීම කේසෙ වෙතත් වටිනා ඛනිජ සම්පත් සොයාගෙන කියලයි විචාරකයොනම් කියන්නෙ.



# Web Development - වෙබ් අඩවියක් හදමු

Software Engineer කෙනෙක් වීමෙදී බහුලවම රැකිය ඇත්තෙ Web Development වලට. web development කොටස් දෙකෙකට බෙදන්න පුලුවන්. Frontend සහ Backend කියල. Frontend කියන්නෙ මිනිසුන්ට පෙනන කොටස. එය Html, CSS, Javascript වලින් සමන්විත වෙනව. ඒ වගේම jQuery, Bootstrap ඉගෙන ගෙනීමත් web development වලට අනිවර්යයි. technologies කීපයක් ඉගෙන ගන්න උනාට ඒව ඉගෙන ගනීම පහසුවෙන් සහ ඉක්මනට කරන්න පුලුවන්. තවත් advance දෙවල් කරන්න ඔනි නම් ඒ සදහ react, angular වගෙ ඒවත් ඉගෙන ගන්න වෙනව. නමුත් දැනට අනිවාර්ය නෑ. ඒ වගේම Backend කියන්නෙ මිනිසුන්ට නොපෙනෙන පැත්ත. එම කොටස තියෙන්නෙ වෙබ් අඩවිය Install කරල තියෙන පරිගනකයේ හෙවත් සර්වර් එකේ. උදාහරනයක් ලෙස ගත්තොත් ඔයා හිතන්න ෆෙස්බුක් වෙබඩවිය, එහි ඔයාලට පේන කොටස Frontend එක වන අතර ඔයාලට නොපෙනන පැත්ත Backend එක වෙනව. එහිදී කරන්නෙ ඔයාලගෙ දත්ත ගබඩා කරගෙන ඉදල අවශ්‍ය වෙලාවට ඔයාලට ලබාදෙන එක. ඔයා ෆෙස්බුක් ගිහින් පොටෝ එකක් දැම්මම එක හරි ගනට කපල, හරි තැනක සේව් කරන්නෙ Backend එකෙන්. ඒ විතරක් නෙවී ඔයාගෙ යලුවොන්ට විතර ඒ පොටෝ එක පෙන්නන්නත් ඒ සර්වර් එකේ තියෙන වැඩසටහන ලියන්න ඕන. එකට තමයි කියන්නෙ Backend Programming කියල. මේ සඳහා Python, PHP, Jav වගේ පරිගනක භාෂා යොදාගන්නව. ඉතින් ලෝකෙ තියෙන වෙබ් අඩවි වලින් 70%ක් විතර හදල තියෙන්නෙ PHP වලින්. ඒ වගේම එක ඉගෙන ගන්නත් පහසුයි. ඒ නිසා අපි Geek Magazin එකෙක් Backend යටතෙ PHP උගන්වනව. ඒ වගේම දත්ත ගබඩා කරගන්න MySQL උගන්වනන්ත වීඩියෝ දාල තියෙනව. Html, CSS, Javascripts එක පාඩම් මාලාවකිනුත්, Bootstrap & jQuery තවත් පාඨමාළා දෙකකිනුත් උගන්වන්න වීඩියෝ දාල තියෙනව. මේවා web development වලට අත්‍යාවශ්‍යම දේවල්. ඒවා ඉගෙන ගෙන අවසානයේ අප පවත්වන විභාගයෙන් හොදට ලකුණු අරන් සහතිකයකුත් ලබාගෙන Software Engineer කෙනෙක් වීමට සූදානම් වෙමු.

## HTML 5

HTML කියන්නෙ වෙබ් සයිට් නිර්මාණයේදී මූලිකම දේ. මෙමගින් තමයි බ්‍රවුසර් එකට කියන්නෙ වෙබ් පේජ් එකේ මූලික සැකිල්ල මොකක්ද කියල.  අපි වෙබ් ඩිවෙලොප්මන්ට් මේ පාඩම් මාලාවේදී HTML ඉගෙන ගමු. මේ කොටසෙ ඉගෙන ගන්න වැඩි දෙයක් නම් නෑ. ඊට පසුව මේ යටතෙ අපි ඉගෙන ගමු CSS එමගින් කරන්නෙ අර මූලික සැකිල්ල ලස්සන කරන එක කියල වෙබ් ඩිවෙලොප්මන්ට් කොටස කියෙවුවනම් ඔයාල දැනටමත් දන්නව. මෙහි තුන්වන කොටස විදියට අපි Javascripts ඉගෙන ගමු. මෙය ප්‍රොග්‍රැමින් බාශාවක්. නමුත් එය Java නොවේ. Javascripts වලින් තමයි වෙබ් පේජ් එකේ සිදුවන දේවල් පිලිබඳ තීරන ගන්නෙ.

Episode 01 මේ යටතෙ අපි HTML වල මූලික ඔට පිළිබඳව ඉගෙන ගමු. මේ පහල තියෙන්න HTML වල උදාහරනයක්

## Bootrap 4

HTML පාඩමේ අවසන ඒකකය විදියට ඔයාල ඉගෙන ගන්නව CSS කියන කොටස. මෙකෙන් කරන්නෙ ඔයාගෙ වෙබ් සයිට් එක ලස්සන කරල හැඩ ගන්වන එක. Bootstrap කියන්නෙ ඒ වැඩෙ හොදට ලේසියෙන් කරන්න පුලුවන් css libraray එකක්. මේක හදල තියෙන්නෙ twiter සමාගම. සාමන්‍යයෙන් ඉස්සර අපි සයිට් එකක් කරන්න ගියම මුලිකව තියෙන design වැඩේ කරන්න හරිම අමාරුයි. ඔයාල ඉස්සර තිබ්බ වෙබ් සයිට් දැකල තියේනම් කියව් හරිම කැතයි කියල. twitte එකෙන් තමයි web site වලට ලස්සක design එකක් දෙන්න එයලගෙ concept ඉදිරිපත් කරල මේ bootstrap හදල තියෙන්නෙ. ඉතින් ඒක බාවිතා කරල css code ගොඩක් ලියන්නෙ නැතිව site එක ලස්සන කරගන්න පුලුවන් ලෙසියෙන්ම. අපි මුල්ම පාඩමෙන් බලමු bootstrap ඔයගෙ html page එකකට install කරල පොඩි design එකක් කරන විදිය.

# jQuery

HTML පාඩමේ දෙවන එකකයදී ඔයා ඉගෙන ගන්නව javasrcipt ගැන. javascripts කියන්නෙ වෙබ්සයිට් වල බාවිතා කරන්නගෙ පැත්තෙ ඉදන් එහෙම නැත්නම් frontend එකේ හෙවත් බ්‍රවුසර් එකේදී යම යම් තිරන ගන්න ලියන වැඩසටහන් ලියන්න ගන්න programming language එකක්. උදාහරනයක් විදියට කීවොත් ඔයාට වෙබ් බ්‍රවුසර් එකේ තියෙන ෆොර්ම්ස් එකක් පුරවද්දි ඔයා එ ෆොර්ම් එක පුරවල නැද්ද කියල බලල ඒ මත යම් තිරනයක් ගන්න වගේ වැඩවලට මේ javascript බවිතා කරන්ව. ඉතින් jQuery කියන්නෙ ඒ javascript වැඩ පහසු කරන්න ලියල තියෙන librarry එකක්. එකෙන් ඔයාලට පුලුවන් පහසුවෙන් javascript වලින් ලියල දිග කෝඩ්ස් බොහොම කෙටියෙන් ලියන්න. ඒ වගේම පොටෝ ගැලරි හදන්න, ඇනිමේශන් කරන්න වගේ දේවලටත් jqury බාවිතා කරවනව.

Episode 01


පලමු පාඩමෙන් අපි අපේ html page එකකට jqury install කරගෙන පොඩි කෝඩ් එකක් ලියල බලමු.

# MySQL

MySql කියන්නෙ සර්වර්ස් වල දත්ත ගබඩා කරන්න බාවිතා කරන මෘදුකංගයක්. ඒ වගේම මේ මගින් දත්ත කළමණාකරනය කරන්නත් පහසු කම් ලබාදෙනව. උදාහරනක් ගත්තොත් ඔයාල ෆෙස්බුක් එකේ යම් ටෙක්ස්ට් පෝස්ට් එකක් දැම්මම එක ගිහින් සේව් වෙන්නෙ ෆෙස්බුක් එකේ සර්වර්ස් වල තියෙන මේ MySql දත්ත ගබඩාවෙ. මේකත් හරියටම Excel වගේ දෙයක් තමයි. අපිට පුලුවන් දත්ට එකතු කරන්න, ඩිලීට් කරන්න, සර්ච් කරන්න වගේ ගොඩක් දේවල්. නමුත් Excel වලට වඩා මෙය වෙනස් වෙන්නෙ මෙයට පුලුවන් දත්ත ට්‍රිලියන ගනාන්ක් උනත් සේව් කරන්න. ඒ වගේම ඉක්මනින් අපිට ඕන දත්ත හොයල දෙන්න. එකට විශේෂ Indexing කියන ක්‍රමේ මේකෙ බාවිතා වෙනව. ලොකුම වෙනස නම් අපිට MySql එක්ක පරිගනක බාශාවකින් කතාකරන්න පුලුවන් වීම තමයි.

Episode 01

අපි පලමු පාඩමෙන් බලමු MySql අපේ පරිගනකයට Install කරගෙන PHP Myadmin හරහා දත්ත එකතු කරගන්න ආකාරය.




# PHP - වෙබ් සර්වර් ක්‍රමලේඛණය

PHP කියන්නෙ Server side programming language එකක්. ඒ කියන්නෙ වෙබ් සයිට් එකක් තියෙන පරිගනකයේ හෙවත් සර්වර් එකේ යම් යම් තීරන ගන්න ලියල තියෙන වැඩසටහනක්. උදාහරනයක් ලෙස ගත්තොත් ඔයා හිතන්න ෆෙස්බුක් වෙබඩවිය, ඔයා ෆෙස්බුක් ගිහින ෆොටෝ එකක් දැම්මම එක හරි ගනට කපලණී හරි තැනක සේව් කරන්නෙ PHP වලින්. ඒ විතරක් නෙවී ඒ ෆොටෝ එක කාටද පෙන්නන්න ඕනි කියල තීරනය කරන්නෙත් PHP වලින් ලියල තියෙන වැඩසටහනෙන්. එකට තමයි කියන්නෙ Backend Programming කියල. මේ සඳහා Python" PHP" Java වගේ පරිගනක භාශා යොදාගන්නව. ඉතින් ලෝකෙ තියෙන වෙබ් අඩවි වලින් 70%ක් විතර හදල තියෙන්නෙ PHP වලින්. ඒ වගේම එක ඉගෙන ගන්නත් පහසුයි. ඒ නිසා අපි Geek Magazin එකෙක් Web Development යටතෙ PHP උගන්වනව. මේ පහල තියෙන්න PHP වලින් වැඩකරන ප්‍රකට වෙබ්සයිට් කීපයක්.

- Facebook
- Wikipedia
- Tumblr
- Slack
- MailChimp
- Etsy
- WordPress

Episode 01

පලමු පාඩමෙන් ඔයාලගෙ පරිගනකයට ජ්‍යජ ෂබ්ඒකක කරගන්න ආකරය සහ පොඩි ීජරසවඑ එකක් කදා; කරන ආකාරය ඉගෙන ගමු.

## New Movies - 2021



# ප්‍රයෝජනවත් වෙබ් අඩවි




## Find Teachers


www.eTeaching.lk


මේ වෙබ්සයිට් එකෙන් ඔයාඅලට පුලුවන් ගුරුවරු සොයා ගන්න  ඒ වගේම අලුත් දේ ඉගෙන ගන්න. ප්‍රශ්ණ අසන්න වගේ ගොඩක් දේවල්. ඒ වගේම ගුරුවරුන්ටත් පුලුවන් තමන්ගෙ නෝට්ස් හුවමාරු කරන ටූල් එකක් වගේ බාවිතා කරන්න. ඒ වගේම ඔන්ලයින් විභාග පවත්තල ළමයින්ගෙ දැනුම විශ්ලේශනය කරන්නත් පුලුවන්.

## Download Youtube

www.y2mate.com

මේ වෙබ්සයිට් එකෙන් ඔයාලට පුල්වන් ඕනම Youtube Video එකක් Download කරගන්න. මෙහි විශේෂත්වය නම් වීඩියෝ විතරක් නේවී MP3 File එකක් විදියට Download කරගෙන Audio එක අහන්නත් පුලුවන්.





## Short links

www. bitly.com

මෙම වෙබ්සයිට් එකෙන් ඉතා දිගු වෙබ් ලිපිනයන් කුඩා ආකාරයට හදාග න්න පුලුවන්. උදාහරනක් විදියට කීවොත් ඔයාට ඕන් වෙඩින් කාඩ් එකකට වෙඩින් එක තියෙන ස්ථානයේ ගූගල් මැප් එකේ ලින්ක් එක ප්‍රින්ට් කරන්න. එත් ප්‍රශ්නෙ තමයි ගූගල් මැප් ලින්ක් එක ගොඩක් දිග වීම. ඉතින් ඔයාලට කරන්න තියෙන්නෙ ඒ ලින්ක් එක කොපි කරගෙන මේ වෙබ්සයිට් එකෙන් Short URL  එකක් හදාගන්න එක.




# O/L ICT

ඉතාමත් පහසුවෙන් සාමාන්‍ය පෙළ විභාගයෙන් “A” සාමාර්ථයක් ලබා ගත හැකි මෙන්ම එදිනෙදා ජීවිතයේදී අත්‍යවශ්‍ය වන පරිගණක භාවිතය පිලිබඳ දැනුම ලබාගත හැකි විෂයකි. ඉතාමත් ප්‍රායෝගික මෙන්ම අනාගත වැඩ ලෝකය තුළ අනිවාර්ය අංගයක් ලෙස ක්‍රියාත්මක වන විෂයකි. සාමාන්‍ය පෙළ විෂය නිර්දේශය තුළ ඇති දැනුම බාහිරයෙන් ලබා ගැනීමට නම් ඔබට එකිනෙකට වෙනස් පාඨමාලා 10ක් පමණ හැදෑරීමට සිදුවනු ඇත. බිය සැක නොමැතිව මෙම විෂය තෝරාගන්න. එම තෝරා ගැනීම ඔබව අනාගතයේ විශිෂ්ඨ මගකට යොමු කරනු ඇත. කිසිදු බාහිර පන්තියකට සහභාගී නොවී මෙම සම්පූර්ණ පාඩම් මාලාව නිසි ලෙස අධ්‍යනය කිරීම මගින්ම ඔබට සාමාන්‍ය පෙළ ෂකඹ විෂය සඳහා ඉහලම “A” සාමාර්ථයක් ලබා ගත හැකිය.

Episode 01

අප ICT පලමු පාඩමෙන් දත්ත හා තොරතුරු වල හඳුනා ගැනීමණී වෙනස් කම් හා ප්‍රයෝගික යෙදීම් (ප්‍රශ්න පත්‍ර තුළ) පිළිබඳව සාකච්චා කරමු.



# A/L ICT

ඔබ ගණිතණී විද්‍යාණී කළාණී වාණිජ හෝ තාක්ෂණ යන කුමන විෂය ක්ශේස්ත්‍රයකින් උසස් පෙළ සඳහා ඉදිරිපත් වීමට සැලසුම් කළද ඔබට එයින් එක විෂයක් ලෙස ICT තෝරා ගත හැකි මෙන්ම තෝරාගත යුතුම විෂයකි. ඔබ විශ්වවිද්‍යාලයකට ඇතුලත් වීමට බලපාන ප්‍රධාන සාධකය හෙවත් Z-score නම් අගය අඩු මහන්සියකින් වඩා වැඩි ප්‍රමාණයක් ඉහල නංවා ගැනීමට වඩාත්ම පහසු විෂය වන්නේ මෙයයි. සාමාන්‍යපෙළ තොරතුරු තාක්ෂණය හදාරා තිබීම හෝ සාමාන්‍ය පරිඝනක හසුරවන්නෙකු වීම මෙම විෂය ඉගෙනීමට වඩාත් පහසු කරවන අතර අනෙකුත් අයටද උනන්දුව මත පහසුවෙන් ධාරණය කරගත හැකිය. රැකියා වලට අමතර සුදුසුකමක් ලෙස යොදාගත හැකි මෙම විෂය තෝරා ගැනීමට මම ඔබට ආරාධනා කරන්නෙමි. කිසිදු බාහිර පන්තියකට සහභාගී නොවී මෙම සම්පූර්ණ පාඩම් මාලාව නිසි ලෙස අධ්‍යනය කිරීම මගින්ම ඔබට උසස් පෙළ ICT විෂය සඳහා ඉහලම “A” සාමාර්ථයක් ලබා ගත හැකිය.

Episode 01

අප ICT පලමු පාඩමෙන් දත්ත හා තොරතුරු වල ජීවන චක්‍රයණී අර්ථ දැක්වීමණී ගතිලක්ෂණ මෙන්ම යෙදීම් පිළිබඳව සාකච්චා කරමු.

## Google Doc

Google Docs කියන්නේ Word processing program එකක්. Google Offine Suite එකේ ඇතුලත්. Google Docs වලට අන්තර්ජාලය ඔස්සේ internet browser එකකින් අවතීර්න විය හැකියි. අන්තර්ජාලය පදනම් කරගත් යෙදුමක් ලෙසත් IOS හෝ Android දුරකතනයක් බාවිතයෙන් mobile app එකක් ආකාරයෙන් මෙම යෙදුමට අවතීර්න විය හැකියි.


මෙම software එක භාවිතා ප්‍රදාන වාසිය නම් ඉතා පහසුවෙන් online real time කන්ඩ්ඩායමක් සමග  වෙන්ස් කිරීම් කිරීමට හැකි වීම. අප මෙම පාඨමාළාවෙන් Google Docs වල වියුහය හදුනා ගැනීමේ සිට Mail Merge වැනි සංකීර්න දේවල් පවා කරන ආකාය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකියි.

## MS Excel

Microsoft excel කියන්නේ electronic spreadsheet program එකක්. එක විශාල දත්ත වගුවක් කිව්වොත් නිවැරැදියි. Microsoft excel වලින් දත්ත එකතු කරන්න, දත්ත සැසදීම් කරන්න, දත්ත ගබඩා කරන්න, SAP programmes හදන්න, දත්ත නිරූපණය කරන්න සහ දත්ත පිලිවෙලට ඉදිරිපත් කරන්න යොදාගන්න පුලුවන්. ඔයාලගෙ සම්පත් පිලිබදව අවබෝධයෙන් සිටීමේ සිට සුලු ගනනයකිරීම් කිරීම හා අවසාන SUB සෑදීම දක්වාණී දත්ත විශ්ලේශන වාර්තා සෑදීම ව්‍යාපාර ඉදිරි විකුනුම් පුරෝකතනය කිරීම  මෙහි ප්‍රයෝජන කීපයකට උදාහරණ විදියට දක්වන්න පුලුවන්. අප මෙම පාඨමාළාවෙන් Microsoft excel වල වියුහය හදුනා ගැනීමේ සිට දත්ත සමග වැඩකරනා ආකාරය, සමීකරන භාවිතා කරන ආකාරය, දත්ත නිරූපනය හා අර්තකතනය කරනා ආකාරය පිලිබදව  මනා අවබෝධයක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

## MS Powerpoint

Microsoft Powerpoint යනු Presentation සෑදීමට ගන්නා වැඩසටහනක්. මෙය බාවිතයෙන් ඔබට පුලුවන් යමක් Present කරද්දී Text” Imges” Video ආදිය ඉතා අලංකාරයට ඉදිරිපත් කරන්න. වර්ථමානයේ එය Business සහ Lec-turing සඳහා ඉතා බහුලව භාවිතා කරනවා. ඉතින් අපි ඉගෙන ගමු කොහොද මෙවැනි Presentation එකක් සාදාගන්නෙ කියල සහ මෙවැන්නක් භාවිතා කරමින් Video එකක් සාදාගන්නේ කියල.




# Python Basic

පාසල් විෂය ධාරාවෙත් උගන්වන නිසා ගොඩක් අය බොහෝදුරට Python Programming Language එක ගැන දන්නව ඇති. මෙම භාෂාවේ ඉගෙන ගැනීමට ඇති පහසුව නිසාත් ඒ වටා ඉන්න ඒ වෙනුවෙන් දේවල් කරන සමාජය විශාල නිසාත් පයිතන් පරිගනක භාෂාව අද වනවිට විශාල පරාසයක විහිදී පවතිනව. Desktop Softwares, Web Application, Business Analysing & Artificial Inteligent වගේ සෑම දේකටම අද පයිතන් බාවිතා කරනව. විශේෂයෙන් කෘතිම බුද්ධි නිර්මානයට මේ භාෂාව බාවිතා කරන නිසා පයිත්න් ඉගෙන ගැනීම ඉතාම වටිනව. අපි මේ පාඩම් මාලාවෙන් පයිතන් මුලික දේවල් ඉගෙන ගෙන පසුව පයිතන් බාවිතයෙන් කෘතිම බුද්ධි නිර්මාණය ගැනත් ඉගෙන ගමු.

Episode 01

Python Install කරගෙන සරල ප්‍රෝග්‍රෑම් එකක් ලියල run කරන්න ඉගෙන ගන්න ඔයාලට පුලුවන්.





# Python GUI - PyQt5

පයිතන් ඉගෙන ගනිද්දී අපි බොහෝ දුරට එහි මූලික දේවල් ඉගෙන ගන්නෙ කමාන්ඩ් ප්‍රොම්ට් (CMD) කියන මෘදුකාංගය හරහා. එහිදී DOS වගි ඉන්ටෆෙස් එකක් තියෙන නිසා ගොඩක් අයට මෙහි ප්‍රායෝගික යෙදුම් ගැන පැහැදිලි වැටහීමක් ලැබෙන්නෙ නෑ. ඒ නිසා අපි තීරනය කලා ඉගෙන ගත්ත පයිතන් භාෂාව යොදාගනිමින් ඇසට පෙන යමක් නිර්මාණය කිරීමට ඉගැන්වීමට. එහිදී ඔයාලට පුලුවන් වෙනව ඔයාගෙ පරිගනකයේ වැඩකරන යුසර් ඉන්ටර්ෆෙස් එකක් සහිත මෘදුකාංග නිර්මානය කිරීමට. ඉන්ඩස්ට්‍රි එකේ පයිතන් භාවිතයෙන් ඩෙස්ක්ටොප් වැඩසටහන් නිර්මාණය කරන්න ගන්නෙ PyQt කියන මෘදුකාංගය. ඒ හරහා පයිතන් මෘදුකංග නිර්මාණය කරන්න අවශ්‍ය පහසුකම් සලසාදී තිබෙනවා. ඉතින් මෙය බාවිතා කරමින් Calculator මෘදුකංගයක සිට ඉතා සංකීර්ණ දත්ත හැසිරවීමේ මෘදුකංග නිර්මාණය දක්වා දේවල් අපි මේ පාඩම් මාළාවෙන් ඉගෙන ගමු.

Episode 01

PyQt 5 ඔබේ පරිගනකයට ස්තාපනය කරගෙන සරල Form එකක් සාදාගන්නා ආකාරය බලමු.

# Net Meter - ඩේට ඉතිරි කරගනිමු




පරිගනකයෙන් අන්තර්ජාලය බාවිතා කරද්දී දන්නෙම නැතුව Data ඉවර වෙනවද? එහෙනම් අපි අද ඒක අඩු කරනන් විසදුමක් ඉගෙන ගමු. ඇත්තටම අපි අන්තර්ජාලය බාවිතයේදී අපි නොදැනුවත්වම Data ඉවරවෙන්නෙ කොහොමද කියල මුලින්ම දැනගමු. සාමාන්‍යයෙන් අපේ පරිගනකයේ මෘදුකාංග, මෙහෙයුම් පද්දති අපි නොදැනුවත්වම යාවත්කාලීන කරගැනීමට අවශ්‍ය ෆයිල්ස් ඩවුන්ලෝඩ් කරගන්නව. සමහර වෙලාවට අපි නොදැනුවත්වම ඩොවුලෝඩ් මැනේජර්ස් වල දාල තිබා ඩොවුන්ලෝඩ්ස් ඉබේම ස්ටර්ට් වෙලා, එහෙම නැත්නම් ටොරන්ට් ප්‍රෝග්‍රෑම් එක ස්ටර්ට් වෙලා ඩවුලෝඩ් පටන් අරගෙන. රාත්‍රී Data වලින් කරගන්න තිබ්බ බොහෝ දේ දවල් වෙලාවෙ පටන් අරගෙන අපේ Data ඉවර කරනව. අනිත් සැලකිලිමත්ම විය යුතු කාරනය තමයි සමහර වෙලාවට අපි විවෘත කරගත්ත වෙබ් පේජ් වල වීඩියෝ ආදිය තිබිල අපි නොදැනුවත්වම ඒකට විශාල Data ප්‍රමාණයක් වැයවීම. එහෙනම් අපේ Data වැයවීම අඩු කරගන්න තියෙන හොඳම ක්‍රමේ තමයි එලෙස Data වැයවෙන වෙලාවන් දැනගෙන එවැනි දේවල් පාලනය කිරීම. උදාහරනයක් ලෙස ගත්තොත් ටොරන්ට් වැඩසටහන විවෘත වෙලානම් අපිට පුලුවන් ඒක අයින් කරල දාල ඒක රාත්‍රී Data වලින් ගන්න. වීඩියෝ ලෝඩ් කරන වෙබ් පේජ් එකකට ගියාත් ඒක close කරල දාන්න හෝ එකෙ text ටික ලෝඩ් උන ගමන් internet connection එක තාවකාලිකව විසන්දි කරන්න. ඉතින් කොහොමද අනවශ්‍ය ලෙස Data වැයවෙන වෙලාවට දැනගන්නෙ. ඒකට විවිද වර්ගයේ මෘදුකාංග අන්තර්ජාලයේ තියෙනව. එයි හොද මට්ටමේ එකක් තමයි Net Meter කියන්නෙ. එහිදී ඔයාලට ඔයාලගෙ Data Usage එක ප්‍රශ්තාර ආකාරයට පෙන්නනව. එහි විශේෂත්වය නම් එය පෙන්වන්නෙ Sytemtray එකේ, ඉහත පින්තූරයේ පෙන්වන පරිදි. Systemtray එකේ පෙන්වන නිසා Data Usage එක ඇස ගැටුනු ගමන් මොකකින්ද Data Use කරනව ඇත්තෙ කියල හොයල අනවශ්‍ය එකක් නම් ඉවත් කරල දාන්න පුලුවන්. අපි ඊලග කලාපෙන් කියල දෙන්නම් කොහොමද මෙලෙස Data වැඩිපුර use කරන්නෙ කියල හොයාගනන් විදිය. ඒ වගේම Net Meter මගින් ඔයාලට දිනකට Use කරනන් ඕනි මෙච්චර Data ප්‍රමානයක් කියල limit කරන්න පුලුවන්. ඒ limit එක පැන්නම එමගින් Data බාවිතාය නවතා දමනව. අවශ්‍යනම් අදාල ලිමිට් එක පැන්නම පරිගනකය Shutdown වෙන්න හදාගන්නත් පුලුවන්.

පහත ලින්ක් එකෙන් Net Meter වැඩසටහන ඩවුන්ලෝඩ් කරගෙන Install කරගන්න.

http://www.hootech.com/NetMeter/hoonetmeter3.exe



# A Gamming Setup



# Online Business - අන්තර්ජාලයෙන් මුදල් සෙවීම

Geek magazine එකෙන් ඉගෙන ගන්න skills use කරල Online business එකක් කරන ආකරය සහ internet එකෙන් සල්ලි හොයන හැටි අපි මේ course එකෙන් කතා කරනව. අපි මුලින්ම මේ online bussine කරන්න පුලුවන් ක්‍රම මොනවද කියල බලමු. පස්සෙ අපි ඒ එක් එක් ක්‍රම ගැන වැඩි දුරටත් ඉගෙන ගමු. ලංකාවෙ වර්තමානෙ ජනප්‍රිය වෙන ක්‍රමයක් තමයි youtube එකෙන් සල්ලි හෙවීම. ඒක කරන්න ඔයාට ඇත්තටම content creation හෙවත් නිර්මන කිරීමේ හැකියාව තියෙන්න ඕනි. ඒ වගේම youtube එකෙන් කරන්නෙ තමන් දන්න skill එකක් කියාදෙන එක හරි ඒ skill එකෙන් යමක් නිර්මනය කර ඉදිරිපත් කිරීම. ඉතින් ඔයාලට skill එකක් තිබීම අනිවර්යයි. ඒ නිසා මුලින skill එකක් හදාගන්න වෙනව. ඊට අමතරව video editing, photo editing වගේ ඒවත් දැන ගන්න ඕනි. ඒකට ඉතින් geek mag tle design section එකේ course follow කරල ඔයාට ඒව ඉගෙන ගන්න පුලුවන්.

අපි ඊලගට බලමු internet එකෙන් freelancing හෙවත් මුදලට පොඩි පොඩි වැඩ ගන්න පුලුවන් වෙබ්සයිට් මොනවද කියල. Fiver, Upwork කියන්නෙ ඒ වගේ වැඩ ගන්න පුලුවන් websites. මේවට company වලින් එක එක වැඩ දානව. website හදන වැඩ. marketing වැඩ, video & photo editing වැඩ typing, cv හදාගන්නව වගේ එක එක ආකාරයේ වැඩ මෙතනින් ගන්න පුලුවන්. ඔයා කියන ගානට එයාල එකග වුනොත් ඔයාට පුලුවන් ඒ වැඩේ ලබාගන්න. ඒක කලාම ඔයාට සල්ලි ලැබෙනව.

ඒ වගේම සල්ලි ටිකක් වියදම් කරල යම් investment එකක් විදියට කරන් පුලුවන් දේවල් අන්තර්ජාලයේ තියෙනව. සමහර ඒවට නිතරම ඇහ ගහගෙනම ඉන්න වෙනව. කොටස් වෙළදපොල වගේ ඒව ඒ ගනයට වැටෙනව. ඒ වගේම එහෙම කාලය යොදවන්න ඕනි නැති ඒවත් තියෙනව. උදාහරන ලෙස domain parking, bitcoing parking වගෙ invwtment. ඒවගෙ ප්‍රශනෙ තියෙන්නෙ invest කලාට වාසියක් ලැබෙයී කියල ෂුවර් කරන්න බැරි එක. luck එක තිබ්බොත් සල්ලි. domain parking උදාහරයකින් කීවොත් facebook කියන සමාගම හදද්දි වෙන කෙනෙක් facebook.com කියන domain name එක අරන් ඉදල. ඒවගේ වෙබ් ඇඩ්‍රස් ලිපිනයක් ගන්න රුපියල් 3000ක් වගේ යන්නෙ. එහෙම ලිපින අරන තියාගන්න එකට තමයි කියන්නෙ domain name parking කියල. ෆෙස්බුක් සමාගමනට ඒ නම නැති නිසා එයාල මුලින්ම එයාලගෙ වෙබ් සයිට් එක දැම්මෙ thefacebook.com ලිපිනයෙන්. පස්සෙ ෆෙස්බුක් සමාගම දියුනු වුනාට පස්සෙ facebook.com කියන ලිපිනය අර කලින් ගත්ත පුද්ගලයට සල්ලි දීල ගත්ත. ඒ ගත්තෙ $200,000 ක මුදලකට. රුපියල් වලින් නම් 39,398,220ක් පමන වෙනව අද වනවිට. ආසන්න වශයෙන් කෝටි 4ක් පමන. ඉතින් රු 3000 හ කොටි 4ක් වෙයි වාසනාව තියේනම්. ඉතින් කරන්න තියෙන්නෙ අනාගතයේ මෙහෙම නමකින් සමාගමක් එයි කියල අනුමාන කරල වෙබ් ලිපින අරන් තියාගන්න එක විතරයි. luck එක ලැබෙන්නත් සල්ලි වලට අරන් තියෙන්න ඕනි නේ.

එ වගේම bitcoing mining එකත් investment එකක් කරල කරන්න පුලුවන්. ඒත් මේව ලංකාවෙ කරන එක එච්චරම ලාබ නෑ. මොකද වියදම අදිකයි. අපි වීඩියෝ ලෙසන්ස් වලදි මේ ගැන වැඩි දුරටත් ඉගෙන ගමු.



# Ethical Hacking - හැකිං වලින් බේරෙමු

Hacking කීවුවම අපිට මතක් වෙන්නෙ නරක දෙයක් වගේ, එහෙම නේද. ඔව් hacking technic නරක වැඩවලට බාවිතා කිරීම නීති විරෝදියි, ඔයාට හිරේ යනත් පුලුවන් ඒ වගේ වැඩ කරල. Geek mag එකේ hacking course එකෙන් අපි ethical hacking ගැන කතා කරන්න බලාපොරොත්තු වෙනව.

hacking සාමාන්‍යයෙන් කොටස් දෙකකට බෙදෙනව. blackhat hacking සහ whitehat hacking කියල. hacking technic නරක වැඩවලට බාවිතා කරන අයට අපි කියනව blackhat hackers, කියල. හොද වැඩවලට බාවිතා කරන අයට කියන්නෙ whitehat hackers, කියල. ඒ වගේම whitehat hacking කොටස් දෙකකට බෙදන්න පුලුවන්. එකක් තමයි security expertල. එයාල hacking ඉගෙන ගන්නව blackhat hackersලගෙන් IT systems වෙබ්සයිට්ස් ආදිය බේරගන්න. ඒ නිසාම univertity වලත් මේ ethical hacking උගන්වනව. අනිත් එක තමයි life hack. උදාහරනයක් අරන් කිවුවොත් life hack කියන්නෙ හරියට ඔයා ගෙදර current එක නැති වෙලාවට වාහනේ එන්ජිමට වයර් ගහල ගෙදරට current ගන්නව වගේ වැඩක්. තියෙන ටූල් එකක් වෙනස් කරල අපිට ඕනි වෙන වැඩක් කරගන්න එක තමයි life hack කියන්නෙ.

ඉතින් අපි මේ course එකෙන් ethical hacking විඩියට security system සහ life hack ඉගෙන ගන්නව.
ඒ වගේම මේ වගේ අලුත් hacking technic reserch කරල හොයාගන්න පුලුවන් නම් ඔයාලට ඩොලර් බිලිය ගනනක් සල්ලි හම්බ කරන්නත් පුලුවන් නීත්‍යානුකූලව. ඉතින් වීඩියෝ ලෙසන් එකෙන් අපි ඒ ගැන වැඩි දුරටත් ඉගෙන එයින් නෝනැවතී ඉගෙන ගමු ඔයාගෙ පරිගනකය දැනටමත් හැක්වෙලාද කියල බලන හැටි.

Security Trics

# Malware Bite

## පරිගණකයේ වයිරස් අයින් කරමු

ලංකාවෙ ගොඩක් අය පරිගනක බාවිතයේදී කරන වැරැද්දක් තමයි යම් වෙබ්සයිට් එකකට ගියාම එහිදී එන ads messages ඇත්ත ඒව කියල හිතල ඒ ඇඩ් එකේ කියන විදියට මෘදුකංග ඉන්ස්ටෝල් කරගන්න එක. ඒ හරහා දන්නෙම නැතුව තමන්ගෙ පරිගනකයට virus isntall කරගන්නව. උදාහරනයකින් කීවොත් සමහර වෙබ් සයිට් වලදී ඇලර්ට් එකක් වගෙ ඇවිත් කියනව ඔයාගෙ පරිගනකයට වයිරස් එකක් ඇවිත්ණී එක අයින් කරන්න මේ කියන මෘදුකංගය ඉන්ස්ටෝල් කරන්න කියල. ඉතින් එහෙම ඉන්ස්ටොල් කරන මෘදුකංගය තමයි ඇත්තටම වයිරස් එක. ඒ වගේම සමහර වෙලාවට ඇලර්ට් එනව මැසේජ් එකක් ආව වගෙ. ඉතින් ඒ වගෙ හැකින් වලට කියන්නෙ ෆිෂිං කියල. මාලු බානව වගෙ ඇමක් දාල ඔයාව බාගන්නව. ඉතින් අන්තර්ජාලය බාවිතයෙදී ආරක්ෂාව ගැන ගොඩක් දැනුවත් වෙන්න ඕනි. අපි ඉස්සරහටත් මේ වගෙ ක්‍රම මොනවද කියල ඔයාලව දැනුවත් කරන්නම්.

Adsware කියන්නෙ පරිගනකයට හානියක් නොකර ඔයාලට නිතරම Ads පෙන්වන මෘදුකාංග වලට. මේව සමහර Crack කරපු මෘදුකංග ස්තාපනය කරද්දී ඉන්ස්ටෝල් වෙනව. පරිගනකයට හානියක් නැතත් පරිගනකය slow වෙන්න පුලුවන් මේව නිසා. මේ වගේ අනවශ්‍ය Adsware වර්ග ඉවත් කරන්න මේ Malwarebite මෘදුකංගයට පුලුවන්.


ඔබේ පරිගනකයේත් Adsware Install වී ඇතදැයි දැනගන්නේ කෙසේද? අනවශ්‍ය ලෙස එක එක Ads ඔබගේ පරිගනකයේ දර්ශනය වීම. පරිගනකය කලින් තිබුනාට වඩා Slow වීම හෝ අන්තර්ජාලයට පිවිසීමේදී පරිගනකය slow වීම හෝ Ad නොපෙන්වන වෙබ්සයිට් වල පවා කරදරකාරී ලෙස Ads දර්ශනය වීම හඳුනාගන්න පුලුවන්.

අද ඔයාලට කියල දෙන්න යන්නෙ එහෙම පරිගනකයට ඉන්ටෝල් වුන Adsware, Malware, Virus ඉවත් කරල දෙන virus guard එකක් ගැන.


පහත ලින්ක් එකට පිවිසීමෙන් ඔබට එය ඩවුන්ලෝඩ් කරගන්න පුලුවන්.


https://www.malwarebytes.com/mwb-download/thankyou/

ඩවුන්ලෝඩ් වෙන මෘදුකංගය මත ඩබල් ක්ලික් ක්‍රීමෙන් ඉන්ස්ටෝල් කරගන්න පුලුවන්. එය මේ ආකාරයට දිස් වෙනු ඇත.
එහි ඇති Install Button එක ක්ලික් කරන්න. එවිට එම වැඩසටහන ඉන්ස්ටෝල් වෙනු ඇත.




එය ඉන්ස්ටෝල් වූ පස එය විවෘත කරගන්න. එහි ඇති Scan Button එක ක්ලික් කර ඔබගේ පරිගනකය Scan කිරීමෙන් පරිගනකයේ නිතරම එන Ads පෙන්වන වයිරස් සහ Malware අකාරයේ වයිරස් ඉවත් කර දමයි. මෙය සිදු කරන ආකාරය වීඩියෝ ලෙසත් එකක් ලෙසද ඔබට නැරඹිය හැක.






# Gimp - පොටෝ සංස්කරණය

Photo editting කිවුවම ඔයාලට මතක්වෙන එකම සොෆ්ට්වෙයා එක photoshop කියල මම හිතනව. නමුත් ඒක බාවිතයෙදි තියෙන එකම ගැටලුව තමයි එය බාවිතා කරන්න මුදල් ගෙවන්න සිදුවීම. වර්තමානයේ එය බාවිතයට මාසෙකට ඩොලර් 21ක් ගෙවන්න ඕනි එක්කෙනෙක්. රුපියල් වලින් නම් 4000කට කිට්ටු අගයක්. ඉතින් business එකක් වෙනුවෙන් නම් මේ ගාන ගෙවන එක ප්‍රශ්නයක් නෙවී. එත් ඉදල හිටල බාවිතා කරන අයට මෙ ගාන අවාසියි. ඒ නිස ගොඩක් අය photoshop crack කරල නීතිවිරෝදි විදියට තමයි බාවිතා කරන්නෙ. ලංකාවෙ තාම මේ නිතිය සාමාන්‍ය පුද්ගලයන්ට ක්‍රියත්මක නොකලට bussiness වලදි මේ නීති බලපාන අවස්තා තියෙනව. කොහොම උනත් Crack කරපු මෘදුකංග දාගත්තම අපි කොයි වෙලාවෙ හැක් වෙයිද දන්නෙ නැති නිසා එය එතරම්ම හොඳ අදහසක් නෙවී. අද කාලෙ තියෙන ransomware එකකට අපි අහු වුනොත් අපේ පරිගනකයේ තියෙන ඔක්කොම ෆයිල්ස් විකෘති වෙනව. ඒ නිසා අපි මේ ග්‍රැෆික් පාඩම් මාලාවෙ මුල් එපිසෝඩ් කීපයක් Free Software එකක් උගන්වන්න තීරනය කලා. Photoshop වගේම ඉහල ගනයේ නිර්මණ කරන්න පුලුවන් මේකෙන්. නමුත් මේකෙ තියෙන එකම ගැටලුව photosop තරම් හොඳ user interface එකක් නැති එක. නමුත් හැක්වීමත් එක්ක ගත්තම ලොකු ප්‍රශ්ණයකුත් නෑ. එකෙ නම තමයි Gimp. ගුරුවරුන්ට තමන්ට අවශ්‍ය පොටෝස් හදාග න්න මෙක බාවිතා කරන්න පුලුවන්. මේක ගැන පාඩම් මාළා කීපයක් ඉගෙන ගෙන අපි photoshp ගැනත් ඉගෙන ගමු. මොකද ඉන්ඩස්ට්‍රි එකේ වැඩ කරන්නෙ photosop වලින් නිසා.

Episode 01

පලමු පාඩමෙන් Gimp Install කරන ආකාරය ඉගෙන ගමු. ඒ වගේම පොඩි එඩිටින් වැඩ ටිකකුත් කරල බලමු.



# Modern Work Place of IT Companies



# Shotcut - විඩියෝ සංස්කරණය

Video Edittin වලට ගොඩක් අය බාවිතා කරන්නෙ Primior Pro කියන වැඩසටහන. නමුත් එක බාවිතයෙදි තියෙන ගැටලුව තමයි මුදල් ගෙවන්න සිදුවීම. එක්කෙනෙක් මාසෙකට ඩොලර් 21ක් ගෙවන්න ඕනි එය බාවිතා කරන්න. ආසන්න වශයෙන් එය රුපියල් 4000කට කිට්ටු අගයක්. ඉදල හිටල විඩියෝ එඩිටින් එකක් කරන්න අයට ඒ වගෙ ගානක් ගේවන එක පාඩුයි. ඒ වගේම එය බාවිතයට උසස් ගනයේ පරිගනකයක් ඕනි වෙනව. ඒ නිසා අපි තීරනය කලා ඔයාලට Free video editing software එකක් උගන්වන්න. ඒකෙ නම තමයි Shotcut කියන්නෙ. මෙකෙන් නම් Premior Pro වගේ ලොකු වැඩ කරන්න බෑ. නමුත් පොඩි පොඩි වැඩ කරගන්න පුලුවන්. පොඩි පරිගනකයක උනත් බාවිතා කරන්න පුලුවන් නිසා බාවිතයට පහසුයි.

ඒ වගේම එහි පාඩම් මාළා කීපයක් ඉවර වුනාට පස්සෙ අපි Davinchi Resolve ගැන ඉගෙන ගමු. එය Premior Pro තරම්ම ඉහල ගනයේ නිර්මාණ කරන්න බාවිතා කරන මෘදුකාංගයක්. එය බාවිතයෙන් තමයි Alitta, Fast and Furiou වගේ ෆිල්ම්ස් එඩිට් කරල තියෙන්නෙ.

## Episode 01

මෙම පාඩම් මාලවෙන් අපි ඔයාලට Shotcut Install කරගෙන පොඩි විඩියෝ එකක් එඩිට් කර එය වෙනස්ම විඩියෝ එකක් ලෙස Render කරගන්න ආකාරය කියල දෙනව.




# නිර්මාණාත්මකව සිතන්න

දරුවන්ගෙ නිර්මාණශීලී හැකියාව වර්දනය කිරීමේ අරමුනින් අපි ලොකයේ සිදුවන නව නිපැයුම් ගැන මේ වැඩසටහනෙන් කතා කරන්න හිතුව. මොකද නව නිපැයුම් කරන්න නම් දැනට තියෙන නිපැයුම් අධ්‍යනය කරන්න ඕනි. ඒ වගේම ඒ විදියට හිතන්න පුරුදු වෙන්නෙත් ඒව ගැන අවබෝදයක් තිබ්බබම. අපි පලමු වැඩසටහනෙන් USB Cable නිර්මාණය කරන ක්‍රියාවලිය අධ්‍යනය කරමු.



# ඉගැන්වීමට බාවිතා කරන මෙවලම්

මේ වැඩසටහනෙන් අපි කතා කරන්න බලාපොරොත්තු වෙනව ඉගැන්වීමේ ක්‍රියාවලියට තාක්ෂනය යොදාගන්න ආකාරය, අලුත් ඉගැන්වීම් ක්‍රම ශිල්ප, ඉගැන්වීම් සඳහා බාවිතා කරන මෘදුකාංග ගැන සහ තාක්ෂනය බාවිතා කරද්දි ගුරුවරුන් මුහුණදෙන ගැටලු විසදගන්න ආකාරය වගේ දේවල්. පලමු වැඩසටහනෙන් powerpoint වල වීඩියෝ play කරද්දි මුහුණ දෙන ගැටලුවට විසදුමක් අපි ඉගෙන ගමු.



# ඉගෙනගන්න ක්‍රම

Geek mag එකෙ learning technique යටතෙ අපි ඉගෙන ගමු ඉගෙන ගන්න ක්‍රම සහ ඉගෙන ගත්ත දේවල් මතක තියාගන්න බාවිත කරන විද්‍යාත්මක ක්‍රම ගැන සහ ඒ සඳහාම හදල තියෙන softwares ගැන. learnig technique යටතෙ SQ3R මෙතොඩ් එක, Retrieval Practice මෙතොඩ් එකණී PQ4R Method එක වගේම ජන්ප්‍රිය Feynman Technique එක වගේ ක්‍රම ඉගෙන ගමු. ඊලගට මොලේ මතකය වැඩි කරන ක්‍රම, foods, tools ආදිය ඉගෙන ගමු.

ඔයාල දන්නවද මොලේ හැදිල තියෙන්නෙ faty accid වලි-න් කියල. ඒ නිසා ඔයා faty accid කැමට ගන්න අමතක කරනන් එපා. මේව සැමන් වගෙ මාලු වලින් මෙන්ම රටකජු වෙගේ ශාකමය දේවලිනුත් ගන්න පුලුවන්. ඒ වගේම පාඩම් කරන අයට තියෙන ලොකුම ගැටලුවක් නේ කමැලිකම. ඉතින් මේ කම්මැලි කමටත් කෑම බලපානව. අධික සීනි ගැනීමෙන් සහ පිටි කෑම මගින් ඔයාලගෙ කමැලිකම වැඩි වෙනව. ඒ නිසා තේ බොද්දි සීනි අඩුවෙන් බොන්න, පාන් වගේ දේවල් අඩු කරන්න.

හොදයි tools යටතෙ අපි ඉගෙන ගමු ඔයාගෙ මොලේ train කරන්න බාවිතා කරන ප්‍රොග්‍රම් එකක් ගැන. ඔයාල ජිම් ගිහින් ඇග හදාගන්නව වගේ මේ වගේ ඉරසබ එරසබ කරන ටූල්ස් වලින් ඔයගෙ මොලෙත් හදාගනන් පුලුවන්. මම අද ඔයාලට කියල දෙන්නම් මේ වැඩේ කරන්න පහසු කරන app එකක් ගැන. එකෙ නම තමයි Lunosity. playsotre එකේ lumosity කියල type කරල install කරගන්න. එකෙ තියෙන games අපේ මොලේ වම වගේම දකුනත් දියුනු කරන්න පුලුවන් විදියට තමයි හදල තියෙන්නෙ.





ඔයාල බොහෝ දුරට අහල ඇති The Matrix Film එක. ඔන්න ඒකෙ 4 වන එක මේ අවුරුද්දෙ නිකුත් වෙන්න නියමිතයි. නමුත් තවම trailer එකක්වත් නිකුත් කරල නම් නෑ. බලමු කොරොනා නිසා ප්‍රමාද වෙයිද දන්නෙත් නෑ. Matrix Film එකෙ මේ අපි ගෙවන ජීවිතේ ඇත්තටම පවතිනවද කියල ප්‍රශ්ණ කරන ඉතා සංකීර්ණ නිර්මාණයක්. අද ඉන්න බොහෝ විද්‍යාඥයන් පවා කියන්නෙ අපේ ජීවිතය ඇත්තටම පවතින එකක් වීමේ සම්බාවිතාව මිලියනයකින් එකක් කියල. ඉතින් මේ ෆිල්ම් එක බලල නැත්නම් බලන්න. බලන ගමන් එහි ගැඹුරු අර්ථයත් හිතන්න. අපී ඉදිරියේදී මේ Film එකේ ගැඹුරු අර්තය ගැන ඔයාලට වීඩියෝ එකක් ගෙන එන්නම්කො.




# New Movies - 2021

# New Games - 2021







# New Songs - 2021






# Documentory

වර්ථමාණයේ තොරතුරු තාක්ශනයේ දියුණුවත් සමග ලෝකයම දේවල් සවයංක්‍රීයව සිදු කිරීමට පෙළඹී තියෙනවා. ඉතින් මේ සඳහා යාන්ත්‍රිකව නිර්මාණය වන දේවලට තමයි අපි රොබෝස්ලා කියන්නෙ. 1800 ගනන් වල සිටම මේ හා සම්බඳ පර්යේශණ කෙරුනත් වර්තමානයේ කෘතිම බුද්දි තාක්ශනයේ දියුණුවත් එක්ක මේ රොබොට්ස්ලා තනිව තීරන ගෙන වැඩ කරන තැනටම නිර්මාණය වෙලා තියෙනවා. බොස්ටන් ඩයිනමික් ආයතනය විසින නිර්මානය කරන ලද වර්ථමානයේ මිලදී ගැනීමට ඇති රොබොට්ස්ලා. ඒවාට තනියම නොවැටී ඇවිදීම මෙන්ම දිවීමටද පුලුවන් කම ලැබිල තියෙනවා. ඉතින් අපි මේ රොබෝ තාකශනයේ දියුණුව සහ වර්ථමාණයේ ලෝකය තාක්ශනිකව ගමන් කරන්නේ කුමන දිසාවටද යන්න ඔබට දැනගැනීමට මේ වැඩසටහ ඉදිරප්ත් කරනවා.

අප මේ Documentory වැඩසටහ අන්තර්ජාලයේන් ලබාගෙන ඔබ වෙත ඉදිරිපත් කරන්නේ අලූත් දේවල් ඉගෙන ගැනීමට විදේශිකයන්ට ඇති උනන්දුව ඔබ තුලත් ඇති කිරීමටයි. ඒ වගේම මේවා බාශා පරිවර්තනයේන් තොරව ලබාදීමට අපි බලාපොරොත්තු වෙනවා. ඔබ උත්සාහ කරන්න ඒවා තනිව තේරුම් ගැනීමට. ඒ වගේම අපි ඒ සඳහා විශේෂ ටූල් එකක් එයට එකතු කර ත්බෙනවා. එහිදී ඔබට ඉංග්‍රීසි උප්සිරසි ලබාදී තියෙනවා. ඔබට ඒ උපසිරසි වල යම් වචනයක් තේරුම් ගැනීමට අපහසුනම් එතනදී Space Bar එක ඔබා වීඩියෝ එක නවත්තන්න. එතකොටම ඒ මොහොතේ දර්ශනය වන උප්සිරසි එක සිංහලට පරිවර්තනය වී ඔබට පෙන්වන අතර එහි වචන වල වෙන වෙනම තේරුම ගෙන හැර දක්වනවා. ඒ හරහා ඉංග්‍රීස් භාශාවත් ඉගෙන ගනිමින් අලූත් දේවල් ඉගෙන ගන්න උත්සාහ කරන්න.


Download Wallpapers
(Click Here)


## Download Softwares



- Net Meter
- Malwarebite
- Wamp Server
- Gimp
- Shotcut
- Python
- Codek Pack

## Download e-Books

- Elcectronic Circuits
- 101 Excel Formulas
- Killer Presentation
- Python Course
- PHP Development
- HTML Game Dev





# ඔබේ නිර්මාණ

නිර්මාණශීලී ඔයාලගෙ නිර්මාණ Geek Magazine එක හරහා හැමෝටම පෙන්වන්න අපි තීරණය කලා. ඉතින් ඔයාලගෙ නිර්මාණ අපිට එවන්න. ඔයා නිර්මාණ කරන්නෙ නැත්නම් පොඩි හරි නිර්මාණයක් කරන්න පටන්ගන්න. මොකද මේ කුතුහලය තියෙන කාලෙ නිර්මාණ කලේ නැත්නම් ඔයාලගෙ නිර්මාණශීලිත්වය දන්නෙම නැතුව නැතිවෙලා යනව කියල අපි පරීක්ෂන වලින් දන්නව. වැරදි වැරදි හරි පොඩියට පටන් ගත්තම දවසක ඔයාල ලොකු නිර්මාණ කරන අය බවට පත්වෙනව. මොනවගේ නිර්මාණද අපිට එවන්න ඕනි කියල පහලින් ලිස්ට් කරනව.

- Atwork
- Animation
- Shortfilms
- Documentories
- Softwares
- Music tracks
- Video of Electronic Inventions

# We are hiring

**We are looking for part-time content creators who can make tutorial video lessons about computer knowledge. If you are interested, please send your cv with your content ideas that you hope to produce.**


**email: contactus@eteaching.lk**

# Q & A - ඔබේ ගැටලු

**රටේ කොරෝනා වසන්ගත තත්වය නිසා පාසලෙන් ලබන විශය දැනුම ලබාගැනීමට අපහසුට අපොහොසත් වී ඇත. එවැනි විශය කරුණු ඉගෙන ගැනීමට ක්‍රමයක් තිබේද?**

ජාතික අධ්‍යාපන ආයතනයේ youtube channel එකෙන් ඔබට අවශ්‍ය විශය දැනුම ලබාගන්න පුලුවන්. එහි ලින්ක් එක
[https://www.youtube.com/c/ChannelNIE](https://www.youtube.com/c/ChannelNIE)

**පරිගනකයේ වෙබ් බ්‍රවුසර් එකෙන් ඉන්ටර්නෙට් පිවිසීමේදී** your connection is not secure **කියල ඒටෑ එකක් එනව. එයට හේතුව කුමක්ද සහ එයට පිළියම කුමක්ද?**




පරිගනකයෙන් ඔබ වෙබ් සයිට් එකක්කට පිවිසෙද්දී ඔබේ පරිගනකයේ සහ එම වෙබ් සයිට් එක පවතින සර්වර් එක අතර connection එකක් හැදෙනව. එම connection එක අතර සිදුවන දේවල් පිට ඉන්න කෙනෙක්ට බලන්න පුලුවන්. ඉතින් එය වලක්වන්න එම connection එක ආරක්ෂිත කරන්න https කියන ක්‍රමවේදය යොදාගන්නව. එහිදී යම් දින වකවානුවක් සඳහා certificate එකක් නිකුත් කරනව. එම certificate එක කල් පැනීම හෝ එහි අලුත් වර්ශන්ස් පැමිනීම නිසා එය හඳුනා ගැනීමට නොහැකිවීම යන කාරනා නිසා එම certificate එක fail වෙනව. ඒ වෙලාවට ඔබේ වෙබ් බ්‍රවුසර් එකෙන් එම connection එක ආරක්ෂිත නෑ කියල ඔය මැසේජ් එක එනව. ඒ ගැටලුව විසඳාගන්න පහත ක්‍රම කීපය අත්හදා බලන්න.


1) ඔබේ පරිගනකයේ වෙලාව නිවැරදිද කියා චෙක් කරන්න. එය වැරදිනම් මුලින්ම එය නිවැරදි කර නැවත web page එක refresh කරල බලන්න.

2) ඔබේ බ්‍රවුසර් එක update කරන්න. සාමන්‍යයෙන් මෙය සවයංක්‍රීයව සිදු වුවත් එසේ update වී නොමැතිනම් යාවත්කාලීන කර නැවත refresh කර බලන්න.

3) windows xp වැනි පරන OS සඳහා දැන් පවතින ප්‍රදාන ගනයේ Chromem" Firefox Updates ලබා නොදේ. ඒ නිසා පරන OS එකක් බාවිතා කරන්නේ නම් අලුත් එකකට යොමු වන්න. නැතිනම් windows xp සඳහා වැඩකරන වෙනත් වෙබ් බ්‍රවුසර් එකක් අත්හදා බලන්න.

4) ඉහත විස්තර කරන ලද ආරක්ෂිත ක්‍රමවේදය එම වෙබ් සයිට් එක සඳහා අක්‍රීය කිරීම. මෙය එතරම්ම හොඳ ක්‍රමයක් නොවුනත් එම වෙබ් සයිට් එක සහ ඔබ අතර පවතින connectin එකෙන් සංවේදී තොරතුරු හුවමාරුවක් සිදු නොවේනම් ඔබට එය උත්සාහ කර බලන්න පුලුවන්.

Powerpoint **වැඩසටහනේ** Insert tool **එක මගින් වීඩියෝ එකක් ඇඩ් කරන්න ගියාම පහත ආකාරයේ** error message **එකක් එනව. එය හදාගන්නේ කෙසේද?**




මෙයට හේතුව අදාල වීඩියෝ එක read කරන ආකාරය ඔබගේ පරිගනකය නොදැනීමයි. ඒ සඳහා පරිගනක වලට එම වීඩියෝ ටයිප් එකට සරිලන කොඩෙක් ස්තාපනය කර තිබිය යුතුයි. ඒ සඳහා පහත ලින්ක් එකට පිවිස කොඩෙක් පැක් එක ඩවුන්ලෝඩ් කරගෙන ස්තාපනය කරන්න.

[https://files2.codecguide.com/K-Lite_Codec_Pack_1612_Mega.exe](https://files2.codecguide.com/K-Lite_Codec_Pack_1612_Mega.exe)

**ඔබට පවතින තාක්ෂනික ගැටලු පහත වෙබ් පේජ් එකට ගොස** Ask Question Button **එක** click **කර අපට යොමු කරන්න. එවිට අප විසින් හෝ ඒ පිළිබඳ දැනුමක් ඇති අය විසින් අදාල ගැටලුවට විසඳුම් ඉදිරිපත් කරනු ඇත.**
[https://eteaching.lk/questions](https://eteaching.lk/questions)




# Davinchi Resolve - Full Setup


# ගීක් ගිණුමක් සාදා ගනිමු

Geek Magazine එක මිලදී ගැනීමට, කියවීමට, අලුත් IT News දැනගැනීමට, ඔබට තියෙන ප්‍රශ්ණ ඇසීමට ආදී බොහෝ දේ සඳහා ඔබ Geek Account එකක් සාදාගත යුතුයි. අපි දැන් බලමු කොහොමද Geek Account එකක් හදාගන්නෙ කියල.


ඒ සඳහා ඔයාල www.eTeaching.lk වෙබ් සයිට් එකට පිවිසිය යුතුයි. එහි ඉහල දකුණු කෙලවරේ ඇති Free Register Button එක Click කරන්න.





එවිට පහත ආකාරයේ Form එකක් දක්නට ලැබේවි. එහි 1 ස්ථානයේ Account Type එක ලෙස ඔබට අදාල Type එකක් තෝරන්න. ඉන්පසුව 2 ස්ථානය හෝ 3 ස්ථානයක් Click කරනන්. 2 හරහා ඔබට Email or Phone Number එක මගින් රෙජිස්ටර් වීමට පුලුවන්. 3 මගින් Facebook or Google හරහා ඔබට රෙජිස්ටර් වෙනන් පුලුවන්.




2 ස්ථානය ක්ලික් කර 4, 5, 6 ස්ථාන පුරවා Next කරන්න.





ඔබ Email එකකින් රෙජිස්ටර් වුවහොත් පහත පරිදි දැනීමක් පෙනේවී. එහි කියා ඇත්තේ ඔබගේ Email Address එක තහවුරු කරගැනීම සඳහා Email එකක් යවා ඇති බවයි. Email එක විවෘත කර එහි ඇති Verify Button එක ක්ලික් කිරීම ඔබට පසුව වුවද කල හැකි නිසා මෙහි ඇති Remind Me Leter Click කරන ඉදිරියට යන්න. එවිට ඔබගේ විස්තර පිරවීමට පහත Form එක පැමිනෙනු ඇත. එහි අංක කරන ලද ස්ථාන පුරවා Next Click කරන්න.





ඔබ ගුරුවරයෙක් නම් පමනක් ඊලග පියවරේදී ඔබගේ Subjects එකතු කිරීමේ පියවරකට යයි. එය පසුව වුවද සිදු කල හැකිය. අනිත් අය කෙලින්ම ඔබගේ Dashboard එකට පිවිසෙනු ඇත.

# ගීක් මැගසින් එකේ වීඩියෝ පාඩම් නරඹන ආකාරය




Geek Magazine Desktop මෘදුකාංගය විවෘත කලාම ඉහත ආකාරයේ මුහුණතකින් එය දැකගන්න පුලුවන්. මවුස් එකෙහි ස්ක්‍රෝල් එක කරකැවීමෙන් අහි ඇති වීඩියෝ අතර පහසුවෙන් ගමන් කරන්න පුලුවන්. එහි පින්තූර මත ක්ලික් කිරීමෙන් එයට අදාල Tutorial Videos නරඹන්න පුලුවන්. ඒ සඳහා Desktop Software එක Download කරගැනීම පහත ලින්ක් එකෙන් පුලුවනි.

https://eteaching.lk/magazine/download/app






ඔබගේ OS එකට අදාල ෆයිල් එක ඩවුලෝඩ් කිරීමට අදාල බටින් එක මත ක්ලික් කරන්න. එය Portable App එකක් නිසා Install කිරීමට අවශ්‍ය නොවේ. Zip File එක Extract කරගැනීමෙන් අනතුරුව එහි තුල ඇති Geek_ Mag ලෙස ඇති File එක මත ඩබල් ක්ලික් කිරීමෙන් එය විවෘත කරගැනීමට පුලුවනි. DVD එක මිලදී ගත්තේනම් එය තුලද එවැනි ආකාරයේ මෘදුකාංගයක් ඇති අතර ඔබගේ OS එකට අදාල ෆොල්ඩර් එක තුල ඇති Geek_Mag මෘදුකාංගය මත ඩබල් ක්ලික් කිරීමෙන් එය විවෘත කරගැනීමට පුලුවනි.

එසේම ඔබගේ Mobile Phone එකේ හෝ පරිගනකයේ බ්‍රවුසර් එකෙන් පහත වෙබ් සයිට් එකට පිවිසීමෙන්ද අදාල Tutorial Video නරඹන්න පුලුවන්


https://eteaching.lk/magazine/geek/1

එවිට පහත දැක්වෙන ආකාරයේ පින්තූර මත ක්ලික් කිරීමෙන් එයට අදාල වීඩියෝ එක නැරඹීමට පුලුවන. ඒ සඳහා Online Version එක හෝ DVD එක මිලදී ගැනීම කරන ආකාරය පහල පිටුවෙන් බලමු.





ඉංග්‍රීසි ඉගෙන ගැනීමට සපයා ඇති ටූල් එක ඉංග්‍රීසි මධ්‍යයෙන් ඇති වීඩියෝහිදී Space Bar එක ඔබා ලබාගන්න පුලුවනි.



# ගීක් මැගසින් එක මිලදී ගන්න ආකාරය





Geek Magazine එකෙහි PDF හෙවත් e-Book Version එක ඔයාලට නොමිලේ Download කරගැනීමට පුලුවන් වන අතර ඉහත අකාරයට වීඩියෝ පාඩම් මාලා නැරඹීමට නම් Geek Magazine එකෙහි Online/ DVD Version එක මිලදී ගත යුතුය. එය ක්‍රම දෙකකට කල හැකිය.


## 01) පළමු ක්‍රමය (වෙබ් අඩවිය භාවිතයෙන්)

ඒ සඳහා පහත ලින්ක් එකෙන් වෙබ් අඩවියට පිවිස Buy Button බාවිතා කරමින් ඔබ කැමති Version එක මිලදී ගැනීමට එයට අදාළ Button එක ක්ලික් කරන්න.

https://eteaching.lk/magazine/geek/1





අප මෙහිදී Online Version එක මිලදී ගැනීම සම්බදව විමසා බලමු. එයට අදාළ Buy Online Version Button එක ක්ලික් කිරීමෙන් පහත අකාරයේ වෙබ් පේජ් එකක් දැකගන්න පුලුවන්.




ඔබ මිලදී ගන්නේ DVD Version එකනම් මෙහි අමතරව ඔබගේ ලිපිනය එකතු කරන්න ස්තානයක් වැඩිපුර පවතිවි.


ඉහත පේජ් එකෙහිදී ඔබට පුලුවන් එක් මාසයක සඳහා පමනක් මිලදී ගැනීමට One Time Purchase Option එක තෝරාගන්න. මාස තුනක් සඳහා එක සැරේ ගෙවීම් කිරීමට Subscribe for 3 months යන්න තෝරන්න. (මාස තුනක් සඳහා එකවර ගෙවීම් කරන්නේ නම් විශේෂ වට්ටම් මුදලක්ද ඔබට හිමිවේ) ඉන්පසුව ඔබට පුලුවන් ගෙවීම් Online හෝ Bank යන ආකාර දෙකෙන් ඔබට පහසු ක්‍රමයකට ගෙවීම් කරන්න. Onlene Pay කිරිමේදී Credit/Debit Cards, Genie/Frimi, eZ/m cash, Sampath Internet Banking යන ඕනෑම ක්‍රමේකට ගෙවීම් කරන පුලුවන්. ඔන්ලයින් ගෙවීම් කිරීමට Online Payment යන්න තෝරා Submit Order Request Button එක ක්ලික් කරන්න. එහි Pay Now Button එක ක්ලික් කරන්න.

එවිට ක්‍රෙඩිට් කාඩ් එකෙහි තොරතුරු ඇතුලත් කිරීමට පේජ් එකක් පැමිනේනී එහි තොරතුරු ඇතුල් කර Pay ක්ලික් කරන්න. එවිට තවත් අංකයක් ඉල්ලා පේජ් එකක් පැමිනේනම් එය ඔබ බැංකුවට දී ඇති ෆෝන් නම්බර් එකට SMS එකක් ලෙස පැමිනේ. එය ඇතුල් කර Submit කරන්න. ගෙවීම් සර්තක වූ පසු ඔබට Payment Success ලෙස දැකග න්න පුලුවන් වේවි. එහි Dashboard Button එක ක්ලික් කර Dashboard එකට ගොස් එහි Magazines Tab එකෙහි Bought Magazines යටතේ ඔබ මිලදී ගත් Magazine එක ක්ලික් කර වීඩියෝ නැරඹා ඉගෙනුම් ක්‍රියාවලිය පටන් ගන්න පුලුවනි.



බැංකු මගින් ගෙවීම් කරන්නේ නම් ඔබට ඉහත Submit Order Request Button එක ක්ලික් කිරීමෙන් පසුව එන ඊලග පේජ් එකෙදී ගෙවීම් සිදුකලයුතු අකාරය විස්තර කර තිබේ. විශේෂයෙන් එහිදී ඔබට Order Code එකක් ලැබෙනවා, ගෙවීම් කරද්දී එය අනිවාර්යයෙන් Remark ලෙස Order Code එක යොදන්න අමතක නොකර. එය යොදන ආකාරය බැංකු කැෂියර්ගෙන විමසන්න.

බැංකුවට ගෙවීම් සිදුකල පසුව Dashbaoard > Magazines > Bought Magazines ඔසේ ගොස් එහි ඔබ ගෙවීම් සිදුකල Order Code එක යටතේ ඇති Mark Payment Done Button එක ක්ලික් කරන්න.




ඉන්පසුව අප ඔබගේ ගෙවීම් තහවුරු කර ඔබ මිලදී ගත්තේ DVD Version එකනම් එය දින 3ක් තුල තැපැල් කරනු ඇති. සන්වරන සීමා නිසා එය ප්‍රමාද වියහැකි බව කරුණාවෙන් සලකන්න. ඔබ මිලදී ගත්තේ Online Version එකනම් එය දිනයක් තුල Active කිරීම කරනු ඇති. ඉන්පසු ඔබට වෙබ් එකෙන් හෝ Desktop App එකෙන් එය නරඹන්න පුලුවනි.

## 02) දෙවන ක්‍රමය (වට්ස්'ඇප් භාවිතයෙන්)

ඒ සඳහා පහත දැක්වෙන බැංකු ගිනුම් වලින් එකකට රු 190/- ක මුදලක් ගෙවීම් කරන්න. එහිදී Remark හෝ Ref Code එක යටතේ ඔබගේ Mobile Number එක දැමීමට අමතක නොකරන්න. එය යොදන ආකාරය බැංකු කැෂියර්ගෙන විමසන්න. ඉන්පසුව ගෙවීම් කල රෙසිප්ට් එකෙහි පොටෝ එකක් 071-4551090 යන වට්ස්'ඇප් නම්බර් එකට එවන්න. එහිදී ඔබ මිලදී ගනේ Online Version එකද නැතිනම් DVD Version එකද යන්න සඳහන් කරන්න" ඔබ මිලදී ගන්නේ DVD Version එක නම් ඔබගේ ලිපිනය අනිවාර්යයෙන් එවන්න.

ඔබගේ පරිගණකයේ OS එක දන්නේනම් එයද එවන්න. එය Windows 7, Windows 8, Windows 10, Mac, Linux 32 bit, Linux 64 bit (ubuntu) ආදී එකක් ලෙස විය හැකිය. මෙම වැඩසටහන Windows XP වලට සහය නොදක්වන නිසා එහිදී ඔබට DVD එක හෝ Desktop App එක භාවිතා කල නොහැක. එවැනි අය Online Version එක මිලදී ගෙන වෙබ් බ්‍රවුසර් එකෙන් වීඩියෝ නරඹන්න.

### ගිණුම් අංක විස්තර

**Sampath Bank**
Account Number: 1142 1401 9302
Account Name: ETEACHER
Branch Name: Boralesgamuwa


**Bank of Cylon**
Account Number: 0084432286
Account Name: J. G. S. Namal
Branch Name: Meewella

මිලදී ගැනීමට පිවිසෙන්න
https://eteaching.lk/magazine/geek/1

සම්පූර්ණ විස්තර සඳහා මෙම වීඩියෝව නරඹන්න
https://www.youtube.com/watch?v=EROsrERLkU4

මිලදී ගැනීමේ ගැටලු ඇත්නම් විමසන්න
Tel: 071-4551090

# Comming Soon



## Arduino Robotic

Electronic Course

අපි මේ පාඩම් මාලාවෙන් අර්ඩිනො බාවිතා කරමින් ප්‍රෝග්‍රැමින් උගන්වන්න බලාපොරොත්තු වන අතර විවිධ පර්යේෂන කරමින් ස්වයං තීර්න ගනිමින් බාධක මැඩගෙන යන රොබෝ කාර් එකක් සහ ඔබේ හඬට සවන් දෙමින් වැඩ කරන ස්මාර්ට් හොම් එකක් නිර්මාණයේ මූලික පියවර තබන්නත් සූදානම්.

## Photo Graphy

Design Course

පොටොග්‍රැෆි පාඨමාලාවෙන් අපි වෙඩින් පොටොග්‍රැපි ගැනත් එම පොටො නිවැරදිව එඩිටින් කරමින් නිර්මාණාත්මක ඇල්බම් එකක් සාදාගන්න උගන්වන්න බලපොරොත්තු වෙනව. ඉතින් ඔබට පුලුවන් ඒ හරහා වෙඩින් පොටොග්‍රැෆර් කෙනෙක් ලෙස රැකියාවට අමතරව කරන ව්‍යාපාරයක් ගොඩානගාගෙන අදායමක් උපයන්න.







## පොඩ්ඩන්ට පරිඝනක

Scratch Programming Course

Scratch කියන්නෙ කුඩා ළමුන්ට පරිඝනක ප්‍රෝග්‍රැමින් ඉගැන්වීම පිණිස නිර්මානය කරන ලද වැඩසටහක්. මෙ හරහා බිල්ඩින් බොක්ස් ලෙස ගෙන යම් ඇනිමේෂන් එකක්, ගේම් එකක් නිර්මාණය කරන්න පුලුවන්. ඇපල් ආයතනයේ නිර්මාතෘ ස්ටීව් ජොබ්ස් විසින් පවසලා තියෙනව ඇමරිකාවේ සියලූ පුරවැසියන් පරිඝනක ප්‍රෝග්‍රැමින් ඉගෙනගත යුතුයි කියල. මොකද ඒ හරහා ඔවුන්ට තමාගේ ප්‍රශ්ණ විසදා ගැනීමට අවශ්‍ය සිතීමේ ක්‍රමය වඩිදියුණු කරන නිසා. ඉතින් ඔබේ ළමුන්ටත් මේ දේවල් උගන්වන්න උත්සුක වන්න. අපි මේ දේවල් ඔබේ දරුවාට උගන්වා සහතික පතක්ද ලබාදීමට කටයුතු කරන්න සූදානම්.




# Win 600 Online Magazines

## Share කරල තෑගි දිනමු

අප විසින් ඔයාලට Geek Magazine Online Version එක දිනා ගැනීමට අවස්තාව ලබාදෙන්න තීරණය කරල තියෙනව. ඒ ඔස්සේ ජයග්‍රහනය කරන 100ක් දෙනාට ගීක් මැගසින් එක මාස 6ක් දක්වා නොමිලයේ ලබාගන්න පුලූවන් කම ලැබෙනව. ජයග්‍රාහකයින් වීමට නම් ඔයාල eTeaching.lk වෙබ් අඩවියෙන් ලබාදෙන Karm නම් වූ ලකුණු රැස්කරගත යුතුයි. එය පහසුවෙන් කරන්න පුලූවන් වන්නේ ගීක් මැගසින් එක සොෂල් මීඩියා ඔස්සේ Share කර ගැනීමෙනුයි. ඒ සඳහා පහත ලින්ක් එකෙන් ඔයාගෙ Referer Link එක සොෂල් මීඩියා අඩවි වල Share කරන්න.

[https://eteaching.lk/invite](https://eteaching.lk/invite)

ඒ ඔස්සේ කෙනෙකු පමිණ eTeachin.lk අඩවියේ රෙගිස්ටර් වුවහොත් ඔයාලට Karm 50ක් ලැබෙනව. ඒ වගේම ඒ පුද්ගලය ලබාගන්න Karm වලින් 20%ක් සැමදාම ඔයාලට ලැබෙනව.

මෙලෙස වැඩිම Karm රැසකරගන්න අයට ජයාග්‍රාහකයන් වෙන්න පුලූවන්.

එක් මාසයකට දස දෙනෙක් ජයග්‍රාහකයන් ලෙස තෝරාගන්නවා. එලෙස මාස 10ක් පුරාවට මේ දිනුම් අවස්තාව ලබාගන්න පුලූවන් වෙනව. එහිදී කලින් මාසයේ Magazine මිලදී ගත් අයට වැඩි අවස්තාවක් හිමි වනු ඇති බව කරුණාවෙන් සලකන්න. පහල ඇති ක්‍රම මගිනුත් ඔයාලට Karm ලකුණු රැස්කරගන්න පුලූවන්.

- Share your knowledge
- Answer other.s questions
- Read posts
- Read questions
- Get more likes to your Geek Profile

# Connect With Geeks

## Youtube Channel - Geek Magazine LK

ගීක් පරිගණක ස   රාවෙන් ලබන දැනුමට අමතරව අලුත් පරිගණක දැණුම ලබාගන්න Subscribe කරල තියාගන්න.

## WhatsApp Group

ගීක් පරිගණක ස   රාවේ eBook Version එක නිකුත් වූ විගස ලබාගන්න, යාළුවොත් එක්ක Share කරගන්න එකතු වෙන්න ගෲප් එකත් එක්ක.

## Facebook Group

පරිගණක සම්බඳ ගැටලුවලට විසදුම් Facebook Group එකෙන් අසා දැනග න්න.

## Linkedin

Geek Network එකත් එක්ක Join වෙන්න Jobs ගැන දැනගන්න.

## TikTok

TikTok එකෙනුත් වැදගත්වන පරිගණක දැනුම ලබාගන්න.

## Instagram

Creative Computer Artworks, Photos & Videos නරඹන්න.




[Free Download Geek Magazine PDF Version]

[Freee Download Geek Magazine Viewer]

[Buy Online Version of Geek Magazine]

[Buy DVD Version of Geek Magazine]

[www.eTeaching.lk/geek]

Geek Magazine එක මිලදීගත් ඔබ සැමට බොහොම ස්තුතියි. ඒ හරහා මෙය තවත් වැඩි දියුණු කරමින් ඔබට ඉතා ඉහළ ගනයේ දැනුම් සම්භාරයක් ලබාදීමට අපිට හැකියාව ලැබේනු ඇත. Geek Magazine DVD Version එකේ ව්‍යාජ අනුකරනයක් මිලදී ගැනීමෙන් වලකින්න. ඒවා විකිනීම හෝ ලග තබා ගැනීම නීතිවිරෝදී ක්‍රියාවකි.

Contact us to join  Advertising Program: contactus@eteaching.lk